කරුණාරත්න, හේමමාලි නිලාන්ගනි

*Paper: Diversity*

# වර්තමාන පවුල් ගැටලු නිරාකරණය සඳහා බුදු සමයෙන් ලබා ගත හැකි විසඳුම්

ලාංකික පවුල් සංස්ථාවේ ස්වරූපය යටත්විජිත ආධිපත්‍යයට නතුවීමත් සමඟ නොයෙක් අංශයන්ගේ වෙනස්වීම්වලට ලක්වන ආකාරයක් දැකගත හැකි ය. එහිදි ධනවාදී ආර්ථික රටාව ඔස්සේ මුදල සමාජයේ සියලු ගුණ ධර්මයන් ගිලගත් අතර අඹු සැමි, මව් පිය, දූ දරු සංස්ථාවන් අතර පරතරයක් ද ඇති කරන ලදී. එහිදි විවාහය පෞද්ගලික ජීවිතයේ දි ක්‍රියාත්මක නොවන හුදු සමාජ ප්‍රදර්ශනයක් පමණක් බවට පත්ව ඇත.

මේ ආශ්‍රිතව තවදුරටත් කරුණු විග්‍රහ කිරිමේදී පෙනී යන්නේ පවුල් ඒකක බිඳවැටීමේ ප්‍රශ්නය පොදු සමාජ ප්‍රශ්නයක් වීම වැළැක්විය නොහැකි බවකි. මානසික රෝග, ලිංගික අපචාර, ගණිකා වෘත්තිය, බාලාපචාරය, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, අයාලේ යෑම, දිවි නසා ගැනීම වැනි සමාජ ගැටලු ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අතර මෙම සංකීර්ණ ගැටලු විමර්ශනය කිරීමේදි පැහැදිලි වන්නේ පවුල් ඒකකවල බිඳ වැටීමත්, මානසික සබඳතා පිරිහීමත් මෙබඳු සමාජ ප්‍රශ්න නිර්මාණය වීමෙහි ලා බලපෑම් කොට ඇති බවකි.

තම මතය පමණක් පිළිගැනීම, අනුන්ගේ අදහස් පිළි නොගැනීම, වැරැද්ද නිහතමානීව නොපිළිගැනීම, එකිනෙකාට විරුද්ධ වු අදහස් ආකල්ප දැරීම, ආර්ථික දුෂ්කරතා, ලිංගික තෘප්තියක් නොලැබීම, අස්ථානයේ සැකය, මානසික විකෘතිතාවයෙන් හටගන්නා හිස්ටීරියා වැනි රෝග, පවුල් සංස්ථාව තුළ ගැටලු නිර්මාණය කරන්නාවු මූලබීජයන් කිහිපයක් පමණි.

නූතන තරඟකාරි සමාජ ප්‍රවාහයට හසුව මෙසේ පරිහානිය කරා ඇදී යන පවුල් ඒකකය තුළ පවතින ගැටලු අප්‍රමාණය. බොහෝ සමාජ විද්‍යාඥයන් විසින් මේ පිළිබඳව කරන ලද පර්යේෂණ රාශියකි. නමුත් එසේ අධ්‍යයනය කොට හඳුනාගත් ගැටලු නිරාකරණය කර ගැනීම උදෙසා විසඳුම් ලබාදුන් අවස්ථා අල්පය. ප්‍රස්තුතයට අදාළව හඳුනාගත් ගැටලු වලට බුදු සමයෙන් ලබා ගතහැකි විසදුම් මොනවාද යන්න සාකච්ඡා කිරිම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.